# සොළසමො පාඨො

# මිත්තධම්මො

සො වම්මිකා නික්ඛම්ම තං තථා නීයමානං දිස්වා සංවිග්ගො දුක්ඛප්පත්තො සහායස්ස මෙ අජ්ජ අවස්සෙන උපත්ථම්භං භවිතුං වට්ටතී’ති, තං සමස්සාසෙත්වා අත්තභාවං විජහිත්වා අඤ්ඤතරවෙසෙන රාජපුරිසෙ උපසඞ්කම්ම ඉමං පුරිසං මුහුත්තං මා මාරෙථා’ති දළ්හං වත්වා සො මුහුත්තෙන රඤ්ඤො අග්ගමහෙසියා වසනට්ඨානං ගන්ත්වා සප්පවණ්ණෙන දෙවිං ඩසිත්වා තාය විසෙන මුච්ඡිතකාලෙ මනුස්සවණ්ණෙන වජ්ඣප්පත්තො විසොසධං ජානාතී’ති වත්වා තං ඛණෙයෙව සහායස්ස සන්තිකං ගන්ත්වා රඤ්ඤො තව පක්කොසිතකාලෙ ගන්ත්වා උදකප්පසතෙන දෙවියා සරීරෙ පහරිත්වා නිබ්බිසං කරොහී’ති වත්වා පක්කාමි.

(රසවාහිනී)

පදමාලාව

| | | | |
|---|---|---|---|
| **වම්මිකා** | (නා) | - | තුඹසින් |
| **නික්ඛම්ම** | (පූ.ක්‍රි) | - | නික්ම |
| **තථා** | (නි) | - | එසේ |
| **නීයමානං** | (කි) | - | ගෙනයනු ලබන |
| **තං** | (ස.නා) | - | ඒ (පුරුෂයා) |
| **දිස්වා** | (පූ.ක්‍රි) | - | දැක |
| **සංවිග්ගො** | (ක්‍රි) | - | කලකිරුණේ |
| **දුක්ඛප්පත්තො** | (ස) | - | දුකට පැමිණියේ |
| **මෙ** | (ස.නා) | - | මාගේ |
| **සහායස්ස** | (නා) | - | යහළුවාට |
| **අජ්ජ** | (නි) | - | අද |
| **උපත්ථම්භං** | (නා) | - | උපකාර/ පිහිට |
| **භවිතුං** | (තු) | - | වන්නට |
| **වට්ටති** | (ක්‍රි) | - | වටී |
| **ඉති** | (නි) | - | යැයි |
| **සමස්සාසෙත්වා** | (පූ.ක්‍රි) | - | අස්වසා |
| **අත්තභාවං** | (ස) | - | ආත්මභාවය |
| **විජහිත්වා** | (පූ.ක්‍රි) | - | අත්හැර |

| | | | |
|---|---|---|---|
| අඤ්ඤතරවෙසෙන | (ස) | - | එක්තරා වේශයකින් |
| රාජපුරිසෙ | (ස) | - | රාජ පුරුෂයන් |
| උපසඞ්කම්ම | (පූ.ක්‍රි) | - | එළඹ |
| ඉමං | (ස.නා) | - | මේ |
| පුරිසං | (නා) | - | පුරුෂයා |
| මුහුත්තං | (නා) | - | මොහොතක් |
| මා | (නි) | - | එපා (නො) |
| මාරෙථ | (ක්‍රි) | - | මරව් |
| වත්වා | (පූ.ක්‍රි) | - | කියා |
| රඤ්ඤො | (නා) | - | රජුගේ |
| අග්ගමහෙසි | (ස) | - | අගමෙහෙසිය |
| වසනට්ඨානං | (ස) | - | වසන තැනට |
| ගන්ත්වා | (පූ.ක්‍රි) | - | ගොස් |
| සප්පවණ්ණෙන | (ස) | - | සර්ප වේශයෙන් |
| දෙවිං | (නා) | - | දේවිය |
| ඩසිත්වා | (පූ.ක්‍රි) | - | දෂ්ට කොට |
| තාය | (ස.නා) | - | ඇය |
| විසෙන | (නා) | - | විෂයෙන් |
| මුච්ඡිතකාලෙ | (ස) | - | මූර්ච්ඡා වූ කල්හි |
| මනුස්සවණ්ණෙන | (ස) | - | මිනිස් වෙසින් |
| වජ්ඣප්පත්තො | (ස) | - | වධයට පැමිණි පුරුෂ තෙම |
| විසොසධං | (ස) | - | විෂ බෙහෙතක් |
| ජානාති | (ක්‍රි) | - | දනියි |
| තං ඛණෙයෙව | (සං) | - | එකෙණෙහි ම |
| සන්තිකං | (නි) | - | සමීපයට |
| රඤ්ඤා | (නා) | - | රජු විසින් |
| පක්කොසිතකාලෙ | (ස) | - | කැඳවූ කල්හි |
| උදකපසතෙන | (ස) | - | දියපතකින් |
| දෙවියා | (නා) | - | දේවිගේ |
| සරීරෙ | (නා) | - | ශරීරයෙහි |
| පහරිත්වා | (පූ.ක්‍රි) | - | ගසා |
| නිබ්බිසං | (ස) | - | විෂ නැති |
| කරොහි | (ක්‍රි) | - | කරව |
| පක්කාමි | (ක්‍රි) | - | ගියේය |



නොමිලේ බෙදා හැරීම පිණිසයි

**අභ්‍යාස**

1. 'මිත්තධම්මො' ඡේදය සිංහලට නගන්න.
2. 'මිත්තධම්මො' ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො වම්මිකා නික්ඛම්ම තං තථා නීයමානං දිස්වා සංවිග්ගො දුක්ඛප්පත්තො?
ii. සහායස්ස මෙ අජ්ජ අවස්සයෙන උපත්ථම්භං භවිතුං වට්ටතී'ති කො චින්තෙසි?
iii. සො තං සමස්සාසෙත්වා අත්තභාවං විජහිත්වා අඤ්ඤතරවෙසෙන කුහිං උපසඞ්කමි?
iv. සො මුහුත්තෙන කුහිං ගන්ත්වා සප්පවණ්ණෙන දෙවිං ඩසි?
v. උදකප්පසත්තෙන කස්සා සරීරෙ පහරිත්වා නිබ්බිසං කරොහී'ති වත්වා පක්කාමි?

## සමාස නාම II

### 4. ද්වන්ද්ව සමාසය

ඒක විභක්තික නාම පද දෙකක් හෝ වැඩි ගණනක් හෝ 'ච' නිපාතයෙන් එක පදයක් වන සේ කෙටි කිරීම ද්වන්ද්ව සමාසය යි.

උදා:-
චක්ඛුං ච සොතං ච = චක්ඛුසොතං (ඇස් කන්)
ගීතං ච වාදිතං ච = ගීතවාදිතං (ගායනය හා වාදනය)
පත්තං ච චීවරං ච = පත්තචීවරං (පාසිවුරු)
මාතා ච පිතා ච = මාතාපිතරො (මවුපියවරු)

### 5. බහුබ්බීහි සමාසය

සමාස වන පදවල අර්ථය හැර වෙනත් පදයක අර්ථය ප්‍රධාන වී සිදුවන සමාසය බහුබ්බීහි සමාසය යි.

ආගතො සමණො යං සො = ආගතසමණො (විහාරො - විහාරය)
ජිතානි ඉන්ද්‍රියානි යෙන සමණෙන සො'යං = ජිතින්ද්‍රියො (මුනි - මුනිවරයා)
දින්නං භොජනං යස්ස සො = දින්නභොජනො (භික්ඛු - භික්ෂුව)
අපගතා සිස්සා යාය සා = අපගතසිස්සා (පාඨසාලා - පාසැල)
මහන්තානි ධනානි යෙසං තෙ = මහද්ධනා (සෙට්ඨිනො - සිටුවරු)
බහවො තාපසා යස්මිං සො = බහුතාපසො (අස්සමො - ආශ්‍රමය)

### 6. අව්‍යයීභාව (අබ්‍යයීභාව) සමාසය

උපසර්ගයක් හෝ නිපාත හෝ මුලින් යෙදී ගැළපෙන සමාසය අව්‍යයීභාව සමාස නම් වේ.

උදා:-
උප = නගරස්ස සමීපං = උපනගරං (නගරය ළඟ)
අනු = රථස්ස පච්ඡා = අනුරථං (රියට පසු)
යාව = ජීවස්ස පරිච්ඡෙදං = යාවජීවං (දිවි ඇති තෙක්)
බහි = නගරස්ස බහි = බහිනගරං (නගරයෙන් පිට)
උපරි = පාසාදස්ස උපරි = උපරිපාසාදං (ප්‍රාසාදය මත්තෙහි)


නොමිලේ බෙදා හැරීම පිණිසයි

**අභ්‍යාස**

1. පහත සඳහන් සමාස පද විග්‍රහ කරන්න.

i. උපරිසිඛරං
ii. නිග්ගතජනො
iii. ජාතරූපරජතං
iv. චක්ඛුසොතං
v. අනුරථං

2. පහත සඳහන් පද සමාස කරන්න.

i. පාණිං ච පාදං ච
ii. සම්පන්නානි සස්සානි යස්මිං සො
iii. භත්තස්ස පච්ඡා
iv. දින්නං භොජනං යස්ස සො
v. කාසි ච කොසලා ච

3. පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. දසබලො සාවකානං ධම්මං දෙසෙති.
ii. වනිතායො භින්නසථානි භූමියං පාතෙන්ති.
iii. මාතාපිතරො දාරකානං ඔවාදං කරොන්ති.
iv. කුමාරී උපරිපාසාදං ආරුහති.
v. පෙතා තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති.

4. පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. ඈ නගරය සමීපයෙහි වාසය කළාය.
ii. දායකයා භික්ෂුවට පාසිවුරු පූජා කරයි.
iii. ඒ තාපසයා දිනපතා ගංගාව සමීපයට යයි.
iv. ඔහු දිවි ඇති තෙක් බුදුන් සරණ ගියේය.
v. බ්‍රාහ්මණයා පෙරබත් කාලයෙහි දන් දුන්නේය.

5. පහත සඳහන් පදවල සමාස නාමය දක්වන්න.

i. හංසබකා
ii. මහද්ධනා
iii. අනුරූපං
iv. සීලධනං
v. යාවජීවං
vi. සීතුණ්හං
vii. අඤ්ඤනගරං
viii. දෙවමනුස්සා
ix. ආගතසමණො
x. හත්ථපාදමංසලොහිතං

6. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. සමාස හඳුන්වන්න.
ii. සමාස ප්‍රභේද කීය ද?
iii. සමාස ප්‍රයෝජන ලියා දක්වන්න.
iv. කම්මධාරය සමාසය හඳුන්වන්න.
v. දින්නභොජනො, යාවජීවං, පත්තචීවරං යන පදවල සමාසය නම් කරන්න.

7. 'මිත්තධම්මො' ඡේදයේ එන සමාස පද උපුටා දක්වන්න.